**වලපනේ ප්‍රාදේශීය සභාව - 2020**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

වලපනේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වා දුන් රු.101,500 ක ගිණුමකරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය පිළි ගනිමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැරදි හඳුනාගෙන නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | 2020 වර්ෂයේ රු.826,200 ක් වැයකර මිළට ගෙන තිබුණු කසළ හලන යන්ත්‍රය ඉඩම් හා ගොඩනැගිලි වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මහජන බැංකුවේ ජංගම ගිණුම දිගු කලක සිට ගනුදෙනු කටයුතු සඳහා භාවිතා කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට එහි පැවති රු.24,573 ක ශේෂය ගිණුම් ගත කර නොතිබුණි. | නිරවුල් කර විගණනය දැනුවත් කරන බව | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 118 | සභාවේ සේවය කර, ස්ථාන මාරු වී ගිය, සේවය හැරගිය, විශ්‍රාම ලැබූ හා මියගිය නිලධාරින්/ සේවකයින් 31 දෙනෙකුගෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට | නිරවුල් කිරිමට කටයුතු කර වාර්තා කරමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | අයවිය යුතුව තිබුණු එකතුව රු.1,916,101 ක ණය මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු අයකරන දේපළවල තක්සේරුව වසර 05 කට වරක්වත් නැවත සිදුකළ යුතු වුවද 2010 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව පදනම් කරගෙන බදු අයකරමින් පැවතිණි. | තක්සේරු දෙපාර්තමේන්තුවට 2016 වර්ෂයේ සිට දැනුම් දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,506,562 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,674,486 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් බදු** | | |
| i. | වසර 10 සිට 33 දක්වා කාලය තුළ පවතින රු.1,508,163 ක හිඟ ආදායම් අය කර ගැනීමට ප්‍රමාණවත් පරිදි සභාව කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු සීමා නිර්ණය කිරීමට අදාළ තොරතුරු සභාව තුළ නොමැති වීම නිසා නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි බවත් හිඟ මුදල් කපා හැරීමට ඉල්ලා ඇතත් අනුමැතිය ලැබී නොමැති බව දන්වා ඇත. | ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු වීම. |
| ii. | සමාලෝචිත වර්ෂය අවසානයේ අක්කර බදු ලේඛනය අනුව ඉඩම් 27 කින් රු.61,271 ක අක්කර බදු මුදලක් අයවිය යුතුව තිබූ අතර 2021 ඔක්තෝබර් 31 දිනට තවදුරටත් රු.45,456 ක් අයවිය යුතුව පැවතුණි. | ලිපි මඟින් දැනුම්දීම් කර ඇත. | ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු වීම. |

**(ආ) කුලී**

| | | |
|---|---|---|
| සභාව සතු කඩ කාමර 34 කින් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.3,802,753 ක කුලියක් අයවිය යුතුව පැවතුණි. එයින් බදුකරුවන් 10 දෙනෙකුගෙන් රු.1,024,110 ක මුදලක් වසර 01 සිට 05 දක්වා කාලයක සිට හිඟව පැවතුණද කඩ කාමර දෙකක් සඳහා පමණක් නඩු පවරා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. කඩ කාමර දෙකක් සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. | හිඟ කුලී අයකිරීමට කටයුතු කළ යුතු වීම. |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රාගල නගරයේ රථවාහන නැවතුම්පොළ සඳහා ගාස්තු අයකිරීම සභාව විසින් ඍජුව සිදු නොකර ටෙන්ඩර් මඟින් පුද්ගලයෙකු වෙත රු.410,000 කට බදුදී තිබුණු අතර ඔහු විසින් ගාස්තු අයකර තිබුණද, රු.227,500 ක් සභාව වෙත නොගෙවා 2021 ඔක්තෝබර් 31 දින වන විට හිඟව පැවතුණි. | මේ සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. | ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෞද්ගලික පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතු වටිනාකම රු. 24,564,253 ක් වූ අතර ඉන් රු. 860,452 ක් වසර 04 ක කාලයක් ඉක්මවා තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම රු. 29,284,030 ක් වූ අතර, ඉන් රු. 4,598,583 ක් වසරක කාලයක් ඉක්මවා තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවධානය යොමුකර නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

## 4.1 පාරිසරික ගැටළු

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුර නැගුම වැඩසටහන යටතේ ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ ලබාදීමට කටයුතු කර සමාලෝචිත වර්ෂය වනවිට රු 30,554,104 ක මුදලක් වියදම් කර දඹේකැලේ කසල අපහරණ මධ්‍යස්ථානය 2021 ඔක්තෝබර් 31 දින වන විටත් යන්ත්‍ර සූත්‍ර සවි කරමින් පැවතුණි. පරිසර වැඩසටහන සම්බන්ධයෙන් දීර්ඝ කාලීන අනුමත සැලැස්මක් නොතිබීම, සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් සම්බන්ධයෙන් පරිසර සැලැස්මක් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් කසල කළමනාකරණය විධිමත් පරිදි සිදු වී නොතිබුණි. ප්‍රදේශයේ එක්රැස්වන කසළ රාගල ප්‍රදේශයේ භූමියක් වෙත බැහැර කිරීම පමණක් සභාවෙන් සිදුකර තිබුණි. | 2020 වර්ෂයට සකස්කර තිබූ අතර කොරෝනා වසංගතයත් සමඟ ක්‍රමානුකූලව කසළ කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත්, ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරමි. | කසළ කළමනාකරණය විධිමත් කරගත යුතු වීම. |